සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

## දෙවන වාර පරීක්ෂණය - 2024
## இரண்டாம் தவணைப் பரீட்சை - 2024 / Second Term Test - 2024

| | | |
|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade : 10 ශ්‍රේණිය | ඉතිහාසය - I | කාලය / நேரம் / Time : පැය 1 යි |

නම / பெயர் / Name ..................................................... විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ...........................

සැලකිය යුතුයි:

- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.මෙම ප්‍රශ්න පත්‍රයට ලකුණු 80 ක් හිමිවේ.
- අංක 01 සිට 40 දක්වා ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරු අතරින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) සලකුණ යොදන්න.

---

(01) මහාවංශයේ තොරතුරු ලිවීම ආරම්භ වන්නේ,

(1) පඬුවස්දෙව් රජුගේ පැමිණීමේ සිට ය (2) බුදුන්වහන්සේගේ ලංකාගමනයේ සිට ය
(3) විජයගේ ලංකාගමනයේ සිට ය (4) පණ්ඩුකාභය කුමරු රජවීමෙන් පසු ය

(02) ගල්තලාවල හෝ ගල්කුළු මත ලියූ ලිපි හඳුන්වන්නේ,

(1) ලෙන් ලිපි නමිනි (2) ටැම් ලිපි නමිනි (3) ගිරි ලිපි නමිනි (4) පුවරු ලිපි නමිනි

(03) මහාවංශය රචනා කරන ලද මහානාම හිමියන් වැඩ වාසය කරන ලද පිරිවෙන කුමක් ද ?

(1) සුන්හාත පිරිවෙන (2) මරුගන පිරිවෙන (3) එලග්ග පිරිවෙන (4) දික්සඳ සෙනෙවියා පිරිවෙන

(04) පහත I තීරුවේ දැක්වෙන තොරතුරු II තීරුවේ දැක්වෙන තොරතුරු සමග ගලපා නිවැරදි පිළිතුර තෝරන්න

| I තීරුව | II තීරුව |
|---|---|
| I. බිත්ති | A. බදුලු ටැම් ලිපිය |
| II. ශිලා | B. ඇම්බැක්කේ දේවාලය |
| III. මැටි පුවරු | C. සීගිරිය |
| IV. දැව | D. උළු ගඩොල් මත ලියූ අකුරු |

(1) ABCD (2) DCBA (3) CADB (4) BACD

(05) ලංකාව ට නොපැමිණ වෙනත් අයගෙන් දැනගත් තොරතුරු පදනම් කරගෙන මෙරට ගැන තොරතුරු ලියූ ලේඛකයා කවුරුන් ද ?

(1) රිබෙයිරෝ (2) රොබට් නොක්ස් (3) ක්වේරොස් (4) පිලිප්පස් බැල්දියස්

(06) ශ්‍රී ලංකාව ජනාවාස කරන ලද නූතන මානවයා හඳුන්වන නම කුමක්ද ?

(1) හෝමෝ ඉරෙක්ටස් (2) හෝමෝ නියැන්ඩතාලන්සිස් (3) හෝමෝ සාපියන් (4) විජයාගමනයෙන්

(07) නෙත් කලාපීය ප්‍රාග් ඓතිහාසික මානවයා මහත් රුචියක් දැක් වූ ආහාරයක් වන්නේ මින් කුමක්ද ?

(1) ගස් ගොළුබෙල්ලන් (2) තිත්තයින්
(3) මී මින්නා (4) මුගටියා

Past Papers Wiki

(08) පූර්ව ඓතිහාසික යුගය ට අයත් මැටි ඔරු සුසාන හමු වූ ප්‍රදේශයක් වන්නේ මින් කවරක්ද?

(1) ඉබ්බන්කටුව (2) යටිගල්පොත්ත (3) බෙරගල (4) යාපහුව

(09) මුල් ඓතිහාසික යුගයේ ජනාවාස වල කේවට්ට ගාම යනුවෙන් හඳුන්වා ඇත්තේ,

(1) ගොවියන් විසූ ගම් ය (2) ධීවරයන් විසූ ගම් ය (3) වඩුවන් විසූ ගම් ය (4) ගොපල්ලන් විසූ ගම් ය

(10) මුල් ඓතිහාසික යුගයේ වැටකින් ආරක්ෂා වී ඇති ගම් හඳුන්වා ඇත්තේ කුමන නමකින් ද ?

(1) අපරික්ඛිත්ත ගම් (2) ඔලගම්
(3) පරික්ඛිත්ත ගම් (4) නියම් ගම්

(11) ගංගා නිම්න වලට පිටතින් ආරම්භ වන මුල් ඓතිහාසික යුගයේ ජනාවාස ගංගා නිම්න තුළට අවතීර්ණ වීමට බලපෑවේ,

(1) ගම් වැව් විශාල ප්‍රමාණයක් ඉදිවීම යි (2) ජනගහණය වැඩිවීම ය
(3) ගංවතුර පාලනය කිරීම ආරම්භ වීම යි (4) කටුසර බෝග හිඟ වීම යි

(12) ශ්‍රී ලාංකික මානවයා ගල් මෙවලම් භාවිතයෙන් මිදි යකඩ මෙවලම් භාවිතයට අවතීර්ණ වූයේ,

(1) පූර්ව ඓතිහාසික යුගයයේදී ය (2) මුල් ඓතිහාසික යුගයේදී ය
(3) ප්‍රාග් ඓතිහාසික යුගයේදී ය (4) පූර්ව ඓතිහාසික යුගය අවසානයේදී ය

(13) පූර්ව රාජ්‍ය සමයේදී මෙරට ප්‍රාදේශීය පාලකයකු තොටබොජක ලෙස හඳුන්වා ඇති මූලාශ්‍රය කුමක්ද ?

(1) ජාතකට්ඨ කථාව (2) කොත්ගල්කන්ද සෙල්ලිපිය
(3) පෙරියපුලන්කුලම සෙල්ලිපිය (4) සිතුල්පව්ව සෙල්ලිපිය

(14) ඇළ මාර්ග මගින් සම්බන්ධ කරන ලද වැව් පද්ධතියක් වියළි කලාපීය ජනයා විසින් හඳුන්වා ඇත්තේ කුමන නමින්ද ?

(1) වැව් ප්‍රපතනය (2) ගම් වැව් (3) එල්ලංගාව (4) මහ වැව්

(15) මාතලේ ඇඹුල් අඹේ සෙල්ලිපියේ ප්‍රාදේශීය පාලකයා හඳුන්වා ඇති නම කුමක්ද ?

(1) පොවනි රජ (2) දුහතර රජ (3) රජ (4) මහා පරුමක

(16) ප්‍රාදේශීය පාලකයින් කිහිප දෙනෙකු ඝාතනය කර රාජ්‍යත්වයට පත්වීම හා දසවන රාජ වර්ෂයේ දී දිවයිනේ ග්‍රාම සීමා ලකුණු කිරීම , යන සිද්ධීන්ට අදාළ වන පාලකයා කව්රුන් ද ?

(1) දුටුගැමුණු (2) වසභ (3) දේවානම්පියතිස්ස (4) පණ්ඩුකාභය

(17) අනුරාධපුරය හැඳින්වීම සඳහා නුරුපුර යන පදය භාවිතා කළ මූලාශ්‍රය කුමක්ද ?

(1) කළුදිය පොකුණ සෙල්ලිපිය (2) වල්ලිපුරම් රන් සන්නස
(3) පනාකඩුව තඹ සන්නස (4) බදුලු ටැම් ලිපිය

(18) පියාගෙන් පසු වැඩිමහල් පුතාට රජකම උරුම වීම පිළිබඳ නිවැරදි පිළිතුර කුමක්ද ?

(1) දුටුගැමුණු රජුගෙන් සද්ධාතිස්ස කුමරු ට (2) මුටසීව රජුගෙන් පණ්ඩුකාභය කුමරු ට
(3) වසභ රජුගෙන් වංකනාසිකතිස්ස කුමරු ට (4) ධාතුසේන රජුගෙන් කාශ්‍යප කුමරු ට

(19) මෙරට එක්සේසත් කළ ප්‍රථම පාලකයා වන්නේ,

(1) දුටුගැමුණු රජු ය (2) පළමුවන විජයබාහු රජු ය
(3) වසභ රජු ය (4) පළමුවන පරාක්‍රමබාහු රජු ය

(20) පැරණි රාජ්‍ය තන්ත්‍රයේ පැවති තනතුරු සෙල්ලිපි ඇසුරින් ගැලපූ විට නිවැරදි පිළිතුර වන්නේ,

| A | B |
|---|---|
| 1. නටඅදෙක | A. රාජ්‍ය ලේඛනාගාර ප්‍රධානි |
| 2. නගරගුතික | B. නාට්‍ය අංශ ප්‍රධානි |
| 3. කනපෙඩික | C. නාගරික වාස්තු විද්‍යාඥ |
| 4. නගර වුඩික | D. නගර පරිපාලක |

(1) CBDA (2) BDAC (3) CDAB (4) BCDA

(21) විධායකය හා ව්‍යවස්ථාදායකය හැඳින්වීමට "එක්තැන් සමිය" යනුවෙන් භාවිත කර ඇති මූලාශ්‍රය කුමක්ද ?

(1) මහඇලගමුව සෙල්ලිපිය (2) සිතුල්පව්ව සෙල්ලිපිය
(3) බුද්ධන්නේහෙල සෙල්ලිපිය (4) මැදිරිගිරිය සෙල්ලිපිය

(22) රාජ්‍ය පාලනයේ පහසුව සඳහා රට ආස්ථානවලට බෙදා පාලනය කළ පාලකයා වන්නේ,

(1) වසභ රජු ය (2) දේවානම්පියතිස්ස රජු ය (3) දුටුගැමුණු රජු ය (4) පණ්ඩුකාභය රජු ය

(23) ගැබිණි මව්වරුන් සඳහා පසවන්තිනාමසාලා නම් රෝහල් විශේෂය ඉදිකළ පාලකයා වන්නේ ,

(1) හතරවන කාශ්‍යප රජු ය (2) පණ්ඩුකාභය රජු ය (3) දුටුගැමුණු රජු ය (4) පස්වන උපතිස්ස රජු ය

(24) ලෝකයේ පැරණිතම ගොවිතැන් ක්‍රමය වූ හේන් වගාව හැඳින්වීමට බුත්සරණ නම් කෘතියේ යොදා ඇති නම කුමක්ද ?

(1) පිටිබිම (2) සෙහෙන් (3) සේන් (4) කනත්ත

(25) A හා B තීරු ගලපා නිවරදි පිළිතුර තෝරන්න.

| A | B |
|---|---|
| 1) මජ්ජිම නම් කම්මල්කරු | A. මණ්ඩගල සෙල්ලිපිය |
| 2) තුලදර සුමන | B. වෙහෙර කෙම සෙල්ලිපිය |
| 3) දටික සුමන | C. මුතුගල්ල සෙල්ලිපිය |
| 4) තතවය | D. වේගිරිය සෙල්ලිපිය |

(1) CADB (2) CDAB (3) BCAD (4) CABD

(26) අධ්‍යාපනය ලබාදීමත් ලබා ගැනීමත් පිළිබඳව පැරණි සමාජයේ පැවතියේ ගෞරවනීය හැඟීමක් බව සඳහන් වන මූලාශ්‍රය කුමක්ද ?

(1) දම්පියා අටුවා ගැට පදය (2) ලෝකෝපකාරය (3) සමන්තපාසාදිකාව (4) රසවාහිනිය

(27) අතීතයේ ඇළ මාර්ග හා සම්බන්ධව කටයුතු කළ නිළධාරියා වන්නේ ?

(1) දසගම් ඇත්තන් ය (2) අඩික ය (3) ගමික ය (4) පරුමක ය

(28) වැවක් ජලයෙන් පිරී තිබෙන විට ඇතිවන තරංග වල බලයෙන් වැව් බැම්ම ඛාදනය වීමේ අනතුර වලක්වා ගැනීම සඳහා ඉදිකර ඇති නිර්මාණය කුමක්ද ?

(1) පිටවාන (2) බිසෝකොටුව (3) සොරොව්ව (4) රළපනාව

(29) ශ්‍රී ලංකාවේ වයඹ දිග වෙරළබඩ තැනිතලාව ආශ්‍රිතව අඩි 44 ක් උසැති කෘත්‍රිම පස් බැම්මක් යොදා ඉදිකර ඇති වැව කුමක්ද?

(1) පරාක්‍රම සමුද්‍රය (2) කලා වැව (3) යෝධ වැව (4) මින්නේරිය වැව

(30) සීගිරි නගර සංකීර්ණයේ දක්නට ලැබෙන සුවිශේෂී වාස්තු විද්‍යාත්මක ලක්ෂණය වන්නේ ?

(1) පුද පූජා හා වත් පිළිවෙත් කෙරෙහි ප්‍රමුඛත්වයක් ලබා දීම යි
(2) නගරයේ ආරක්ෂක කටයුතු කෙරෙහි වැඩි සැලකිල්ලක් දැක්වීම යි
(3) පරිසරය රැකෙන පරිදි ගණිතානුකූල ආකෘතියකට සැලසුම් කිරීම යි
(4) ආගමික ගොඩනැගිලි සඳහා වැඩි අවධානයක් දක්වා තිබීම යි

(31) "රුසිරි යොවුන් ගුණ නැණ සියල්ලෙන් නො අඩුවීමුත්... " යනුවෙන් අධ්‍යාපනය ලබා ගැනීම පිළිබඳ ගෞරවනීය හැඟීමක් ප්‍රකාශ වන කවිය ඇතුළත් ග්‍රන්ථය කුමක්ද?

(1) සමන්තපාසාදිකාව (2) ලෝකෝපකාරය (3) සද්ධර්මාලංකාරය (4) සද්ධර්මරත්නාවලිය

(32) පුරාවිද්‍යාඥයින් විසින් මෙරට වියළි කලාපයේ පැරණි රෝහලක නටබුන් සොයගන්නා ලද ස්ථානය වන්නේ කුමක්ද?

(1). ආලාහන පිරිවෙන (2) ඉසුරුමුණිය (3) මහාවිහාරය (4) අභයගිරිය විහාරය

(33) ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් මානවයා "පීඩන ශල්කනය" නමැති තාක්ෂණය භාවිතා කරන ලද්දේ කුමක් සඳහාද ?

(1) ගල් පතුරු ගලවා ගැනීම ට (2) පාෂාණ හැඩ ගැන්වීම ට
(3) ක්ෂුද්‍ර ගල් මෙවලම් තැනීම ට (4) ආයුධ මුවහත් කිරීම ට

(34) පැරණ සෙල්ලිපි වල සඳහන් පරිදි දියකැට පහන යනු ?

(1) සොරොව්ව ට සම්බන්ධ ගල් කුළුනකි (2) වැව් බැම්ම ට සම්බන්ධ වූව කි
(3) පිටවාන ට භාවිතා කරන ලද තවත් නමකි (4) මඩ ඉවත් කිරීමට තිබූ උපකරණයකි

(35) අග්නිදිග ආසියාතික ලක්ෂණ මැනවින් ඉස්මතු වී පෙනෙන මෙරට වාස්තු විද්‍යාත්මක නිර්මාණයක් වන්නේ,

(1) ලෝවාමහාපාය යි (2) ථූපාරාම ස්තූපය යි
(3) ගල් විහාරයේ බුද්ධ ප්‍රතිමාව යි (4) බිසෝ මාලිගයේ සඳකඩ පහන යි

(36) පුරාණයේ මාස දොලහක කාලය හැඳින්වීම සඳහා සෙල්ලිපි වල යොදා තිබෙන්නේ ?

(1) හවජර යන පදය යි (2) තිරීය යන පදය යි (3) විහ යන පදය යි (4) ධන්නමාස යන පදය යි

(37) ඓතිහාසික යුගයේ මෙරට පැවති අපරාධ නීතිය අනුව සැඟවී සිටින අපරාධකරුවන් අල්ලා ගැනීම සඳහා වගකීම පවරන ලද්දේ ?

(1) පරුමක වරුන්ට ය (2) රජයේ නිළධාරීන්ට ය
(3) එම අපරාධකරුවන් අයත් ගම් වැසියන්ට ය (4) දණ්ඩනායකවරුන්ටය

(38) "ලබු, පුහුල්, සොඩල, වැටකොළු ආදි වූ සියළුම ලිය ජාතී හු කටු ඇති රුකය" යනුවෙන් පුරාණයේ භාවිතා කළ එලවළු වර්ග ගැන සඳහන් වන මූලාශ්‍රය වන්නේ ?

(1) ධම්පියාඅටුවාගැටපදයේ ය (2) සද්ධර්මරත්නාවලියේ ය
(3) සද්ධර්මාලංකාරයේ ය (4) ධම්මපදට්ඨ කතාවේය

(39) අතීතයේදී ගුන්ජා යන මිනුම භාවිත කරන ලද්දේ,

(1) දිගුදුර මැනීම ටය (2) කෙටි දුර මැනීම ටය
(3) බර මැනීම ටය (4) අවකාශය මැනීම ටය

(40) "වල්වල දඬුපත් නොකපනු ඉසා" යනුවෙන් පරිසර සංරක්ෂණය ට අදාල උපදෙස් ලබාදෙන සෙල්ලිපිය පිහිටුවා ඇත්තේ

(1) නිශ්ශංකමල්ල රජතුමා ය (2) කීර්ති ශ්‍රී මේඝවර්ණාභය රජතුමා ය
(3) තුන්වන උදය රජතුමා ය (4) හතරවන මිහිඳු රජතුමා ය

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

**දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**தென் மாகாணக் கல்வித் திணைக்களம்**
**Department of Education, Southern Province**

**දෙවන වාර පරීක්ෂණය - 2024**
**இரண்டாம் தவணைப் பரீட்சை - 2024 / Second Term Test - 2024**

| | | |
|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade } 10 ශ්‍රේණිය | **ඉතිහාසය - II** | කාලය / நேரம் / Time } පැය 3 යි විනාඩි 10 යි |

නම / பெயர் / Name } ..........................................................................  විභාග අංකය / சுட்டிலக்கம் / Index No. } ....................................

**සැලකිය යුතුයි:**

- **I කොටසේ පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **II කොටසින් ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න. ඔබ පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව හයකි.**

---

## I කොටස

**(01)** **(අ) පහත (i) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ල ම සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහි ද (ii) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ල ම සපයා ඇති ලෝක ආකෘති සිතියමෙහි ද ලකුණු කොට නම් කරන්න.**

(i) කළු ගඟ, අනුරාධපුරය, රංචාමඩම, පරාක්‍රම සමුද්‍රය, මුන්නේශ්වරම්, ගෝඨපබ්බත, කදුරුගොඩ විහාරය, කුඹුක්කන් ඔය, මාතොට, කැළණිය, ලංකාපට්ටන, ඉරණමඩු වැව (ලකුණු 12)

(ii) කළු මුහුද, කැලිකට්, ලිස්බන්, මලක්කා සමුද්‍ර සංධිය, ඉතාලිය, සුබ පැතිමේ තුඩුව (ලකුණු 06)

(ආ) (i) පහත A, B, C හා D යටතේ දක්වා ඇති ප්‍රශ්න වලට පිළිතුරු අනුපිළිවෙලින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.

A. පත්තිනි දේවාලයක් විවෘත කිරීම ට දකුණු ඉන්දියාවේ චේර රාජ්‍යය ට පැමිණි බව සඳහන් ශ්‍රී ලාංකික රජතුමා
B. මෙරට ශාසන ඉතිහාසය පිළිබඳව ලියැවී ඇති කෘතිය
C. ඒදා හෙළදිව රචනා කල රොබට් නොක්ස් ලංකාවට පැමිණි සමයේ උඩරට සිටි පාලකයා
D. අතීතයේ කිරිමඩු ශාන්ති කර්මය සිදු කළ බවට සාක්ෂි හමුවන ස්ථානය (ලකුණු 04)

(ii) 1. A රූපයේ දැක්වෙන්නේ කවුරුන් ද?
2. මෙම පිළිරුව පිහිටා ඇති ස්ථානය කුමක් ද ?
3. මොහු විසින් සිදුකරන ලද මහා පූජාව නම් කරන්න.
4. මොහු වෙළඳ සම්බන්ධතා පැවැත් වූ රට කුමක් ද ?
(ලකුණු 04)

A රූපය



(iii) 1. B රූපයෙන් දැක්වෙන්නේ කුමක් ද ?
2. මෙය ඉදිකිරීම ට යොදාගෙන ඇති ද්‍රව්‍ය මොනවා ද ?
3. මේ හා සම්බන්ධ ගංගාව කුමක් ද ?
4. මෙය පිහිටා ඇති ඓතිහාසික නගරය සඳහන් කරන්න.
(ලකුණු 04)

B රූපය



## II කොටස

(02) I. සෙල්ලිපි ලියා ඇති ගල්වල ස්වරූපය අනුව වර්ග කළ හැකි ආකාර තුනක් ලියන්න. (ලකුණු 03)

II. ක්‍රිස්තු පූර්ව දෙවන සියවසෙන් පසු ශිලා ලේඛන තුළින් වාර්තා කර ඇති කරුණු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

III. රටක ඉතිහාසය හැදෑරීමේ මූලාශ්‍රයක් ලෙස මහාවංශයේ ඇති වැදගත්කම කරුණු දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 05)

IV. වර්තමානයේ සිදුවන සංවර්ධන කටයුතු නිසා පුරාවස්තු විනාශ වන අවස්ථා තුනක් දක්වා පුරාවස්තු ආරක්ෂා කිරීමේ වැදගත්කම විස්තර කරන්න. (ලකුණු 06)

(03) I. ශ්‍රී ලංකාවේ ගල් යුගයට අයත් ප්‍රජාව වාසය කළ පරිසර කලාප තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

II. පහත A සිට D දක්වා ප්‍රකාශ වලට ගැලපෙන පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.

A. ප්‍රාග් ඓතිහාසික මානවයා වාසය කළ පැරණිතම ගල්ලෙන පිහිටි ස්ථානය

B. පහතරට වියළි කලාපීය ප්‍රාග් ඓතිහාසික මානවයා වාසය කළ ස්ථානය

C. ප්‍රාග් ඓතිහාසික මානවයා වාසය කළ තෙත් කලාපීය එළිමහන් වාසස්ථානය

D. ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් වෙරළාශ්‍රිත එළිමහන් වාසස්ථානය

(බටදොඹලෙන, පතිරාජවෙළ, පාහියන්ගල, අලිගල, බෙල්ලන්බැඳිපැලැස්ස) (ලකුණු 04)

III. ප්‍රාග් ඓතිහාසික මානවයාගේ ජීවන රටාව කරුණු දෙකක් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 05)

IV. ශ්‍රී ලංකාවේ පූර්ව ඓතිහාසික යුගයේ සංස්කෘතිය හැදෑරීම ට ඉවහල් කර ගත හැකි මහා ශිලා සුසාන වර්ග තුන නම් කර ඉන් එකක් විස්තර කරන්න. (ලකුණු 06)

(04) I. මහාවංශයේ සඳහන් වන පරිදි වැවක් කේන්ද්‍ර කොට ගෙන බිහි වූ අතීත ජනාවාස තුනක් නම් කරන්න. (ලකුණු 03)

II. පුරාණ ජනාවාස ව්‍යාප්තිය සඳහා බලපෑ ප්‍රධාන සාධක හතරක් ලියන්න. (ලකුණු 04)

III. පැරණි ජන සමාජය තුළ ගමිකයන් තෝරා ගන්නා ලද්දේ ගෘහපතියන් අතරින් ම බව උදාහරණ දෙකක් මගින් පැහැදිලි කරන්න. (ලකුණු 05)

IV. දේශපාලන බලය මධ්‍යගතවීමේ ක්‍රියාවලියේ දී පාලකයා හැඳින්වීම සඳහා යොදාගන්නා ලද රාජ්‍යත්ව සංකල්පවල අරමුණු මොනවාදැයි උදාහරණ මගින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(05) I. දුටුගැමුණු රජුගේ සේනාවේ සිටි පළමුව පරුමකයන් ලෙස කටයුතු කළ පුද්ගලයින් තිදෙනෙකු නම් කරන්න. (ලකුණු 03)

II. අතීත ජල අවශ්‍යතාවයන් සපුරා ගැනීම සඳහා වැව් ප්‍රපතනය යොදා ගැනීමේ ප්‍රධාන අරමුණු දෙක ලියන්න (ලකුණු 04)

III. මෙරට පාලනය කළ ශ්‍රේෂ්ඨ පාලකයෙක් වන වසභ රජු බලය විමධ්‍යගත කිරීම සඳහා ගන්නා ලද ක්‍රියාමාර්ග දෙකක් විස්තර කරන්න. (ලකුණු 05)

IV. පළමුවන විජයබාහු රජු ශ්‍රේෂ්ඨ පාලකයෙක් ලෙස සලකනු ලබන්නේ ඇයි දැයි කරුණු තුනක් මගින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(06) I. මෙරට පැරණි ජන සමාජයේ පැවති වෘත්තීන් තුනක් නම් කරන්න. (ලකුණු 03)

II. A සිට D දක්වා ප්‍රශ්න වලට අදාළ පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.

A. කාම්බෝජ මහා වෙළඳ සංවිධානයේ මව් රට
B. දන්ත ධාතූන් වහන්සේ මෙරට ට වැඩම කළ වරාය
C. නායක භික්ෂූන් වහන්සේලා යටතේ වැඩ වාසය කළ භික්ෂූන්
D. බ්‍රාහ්මීය සෙල්ලිපි ලියා ඇති භාෂාව (ලකුණු 04)

(දඹකොලපටුන, සිංහල ප්‍රාකෘත, කාම්බෝජය, ඇෆ්ඝනිස්ථානය, සද්ධිවිහරිය, අන්තේවාසික, ලංකා පටුන)

III. මෙරට පැරණි සමාජය තුළ බෞද්ධාගම ට අමතරව හින්දු හා ඉස්ලාම් ධර්මය පැවති බව නිදසුන් දෙකක් මගින් විස්තර කරන්න. (ලකුණු 05)

IV. ශ්‍රී ලංකාවේ අතීත ජන සමාජය තුළ ජනවාර්ගික සහජීවනයක් පැවති බව උදාහරණ තුනක් මගින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(07) I. ඕනෑම රටක පාලනය මෙහෙයවන ප්‍රධාන ආයතන තුන නම් කරන්න. (ලකුණු 03)

II. A සිට D දක්වා ඇති ප්‍රශ්නවලට අදාල පිළිතුරු පිළිවෙලින් ලියන්න.

A. දෙවන සේන රජුගේ අණින් ඉඩම් පිරිනැමීමක ට අදාල නීතිමය කටයුතු සඳහා පැමිණි මහ ලේකම්වරයා
B. ක්‍රි.ව 9 වන සියවසේ සෙල්ලිපියක වටාපත සලකුණින් නිරූපනය වන අදහස
C. අනුරාධපුර යුගයේ දී චීනය සමග දූත සම්බන්ධතා පැවැත් වූ පාලකයා
D. උණ රෝගීන් සඳහා උපසග්ගරෝගනාස නම් රෝහල ඉදිකළ රජතුමා (ලකුණු 04)

III. පුරාණ සමාජයේ ආර්ථික කටයුතු අතර කර්මාන්තවලට වැදගත් තැනක් හිමි වූ බව නිදසුන් දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 05)

IV. මෙරට අතීත ජන සමාජයේ විධිමත් අභ්‍යන්තර වෙළඳාමක් පැවති බව කරුණු තුනක් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 06)

(08) I. ඇළහැර ඇළ මගින් ජලය සපයන ලද වැව් තුනක් නම් කරන්න. (ලකුණු 03)

II. පහත සඳහන් වැව් කරවන ලද රජවරු අනුපිළිවෙලින් ලියා දක්වන්න.

A. හුරුළු වැව B.කලා වැව C. පදවිය වැව D.තිසා වැව (ලකුණු 04)

III. අතීත ශ්‍රී ලංකාවේ උසස් වාරි තාක්ෂණයක් පැවති බව උදාහරණ දෙකක් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 05)

IV. අතීතයේ මෙරට පැවති වාස්තු විද්‍යාවේ විශිෂ්ඨත්වය රුවන්වැලිසෑයේ අත්තිවාරම ඉදිකර ඇති ආකාරය ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 06)

(09) I. පුරාණ කාලයේ රජය ජනතාවගෙන් අය කරන ලද බදු වර්ග තුනක් නම් කරන්න. (ලකුණු 03)

II. පහත සඳහන් නීති පැන වූ රජවරුන් අනුපිළිවෙලින් ලියා දක්වන්න.

A. මිනී මැරීම ට දඬුවම එල්ලා මැරීම බවට නීතියක් පැන වූ පාලකයා
B. ජලාශවල ජීවත්වන පක්ෂීන් නොමැරිය යුතු බවට නීතියක් පැන වූ පාලකයා
C. කිසිදු සතකු නොමැරිය යුතු බවට නීතියක් පැන වූ පාලකයා
D. ගස් කොළන් කළමනාකරණයේ දී රජය විසින් පනවා තිබෙන නීති රීති වල ට අනුකූලව ක්‍රියා කළ යුතු බවට නීතියක් පැන වූ පාලකයා (ලකුණු 04)

III. අතීතයේදී අනුගමනය කරන ලද පරිසර සංරක්ෂණ ක්‍රම වර්තමානය ට අදාල කර ගත හැකි ආකාරය සාධක දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 05)

IV. නිරෝගිමත් ජීවිතයක් ගත කිරීම ට හැකිවන ආකාරයේ ආහාර පුරුදු රටාවක් අපේ පැරණි ජනතාව තුළ පැවති බව නිදසුන් තුනක් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 06)




PAST PAPERS WIKI

Past Papers Wiki



PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi
Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Paper Bank